Provincial Department of Education- Sabaragamuwawa

Sathi Pasala

: SubjectJAPANESELANGUAGE

Week: 06

Grade: 12

Prepared by: K. O. Premathilake, Kuruwita Central Collage

カタカナ

කතකනා අකුරු ලියමු

Aim

කතකනා අක්ෂර නිවැරදි ව හඳුනා ගනිමින් අක්ෂර ලිවීමේ රීති වලට අනුකූලව ලිවීම සහ නිවැරදි ව කියවීම.

කතකනා යනු ජපානයට ආගන්තුක එනම් විදේශීය භාෂාවලින් ජපන් භාෂාවට පැමිණි වචන ලිවීමට භාවිතා කරන හෝඩිය ලෙස සරල ව හැඳින්විය හැක. මෙම හෝඩියද අක්ෂර 46 කින් සමන්විත වේ. එමෙන්ම කතකනා වල උච්චාරණය ඉංග්‍රීසි භාෂාවේ වචන වල උච්චාරණයට බොහෝ දුරට සමාන වේ. විදේශ රටවල නම්,ස්තාන හා පුද්ගල නාම ලියා දැක්වීමෙදී කතකනා අක්ෂර භාවිතා කරනු ලැබේ.

れい： スリランカ、サチニ

ජපන් භාෂාවෙන් ぎおんご යනුවෙන් හඳුන්වනු ලබන ශබ්දානුකරණ පද ලිවිමේදී කතකනා අක්ෂර යොදා ගනු ලබයි.

කන්ජි රූපාක්ෂර වල ඔන් කියවීමේ ක්‍රමය දැක්වීම සඳහා එම උච්චාරණ කතකනා වලින් ලියා දක්වයි.

生

5 strokes
Radical: life 生
Parts: 生

life, genuine, birth

Kun: い.きる、 い.かす、 い.ける、 う.まれる、 うま.れる、 う.まれ、 うまれ、 う.む、 お.う、 は.える、 は.やす、 き、 なま、 なま-、 な.る、 な.す、 む.す、 -う

On: セイ、 ショウ

Jōyō kanji, taught in **grade 1**
JLPT level **N5**
29 of 2500 most used kanji in newspapers

Advanced Katakana Chart

Basic Sounds

ア a	イ i	ウ u	エ e	オ o
カ ka	キ ki	ク ku	ケ ke	コ ko
サ sa	シ shi	ス su	セ se	ソ so
タ ta	チ chi	ツ tsu	テ te	ト to
ナ na	ニ ni	ヌ nu	ネ ne	ノ no
ハ ha	ヒ hi	フ fu	ヘ he	ホ ho
マ ma	ミ mi	ム mu	メ me	モ mo
ヤ ya		ユ yu		ヨ yo
ラ ra	リ ri	ル ru	レ re	ロ ro
ワ wa				ヲ wo
ン n	カタカナ katakana			

Additional Sounds

ガ ga	ギ gi	グ gu	ゲ ge	ゴ go	片仮名
ザ za	ジ zi	ズ zu	ゼ ze	ゾ zo	
ダ da	ジ zi	ズ zu	デ de	ド do	
バ ba	ビ bi	ブ bu	ベ be	ボ bo	
パ pa	ピ pi	プ pu	ペ pe	ポ po	
キャ kya	キュ kyu	キョ kyo	ギャ gya	ギュ gyu	ギョ gyo
ニャ nya	ニュ nyu	ニョ nyo	ハャ hya	ハュ hyu	ハョ hyo
バャ bya	バュ byu	バョ byo	パャ pya	パュ pyu	パョ pyo
マャ mya	マュ myu	マョ myo	ラャ rya	ラュ ryu	ラョ ryo
ジャ ja	ジュ ju	ジェ je	ジョ jo	チャ cha	チュ chu
チェ che	チョ cho	シャ sha	シュ shu	シェ she	ショ sho

Marimosou.com

දැන් අපි කතකනා අකුරු ලියමු..

මෙමගින් අක්ෂර සියල්ල ම ලියන ආකාරය පිළිබඳව දළ අවබෝධයක් ලබා ගැනීමට හැකි වනු ඇත.

එසේ නම් අපි ア、イ、ウ、エ、オ (අ,ඉ, උ, එ, ඔ) ලියන ආකාරය බලමු.



Copyright © learn-japanese-adventure.com

アイロン



Iron

イタリア

Italy

オレンジ ジュース

Orange juice

අකුරු ලිවීමේ දී අංක කොට ඇති පිලිවෙලට ලිවීමට හුරු වන්න.

ඉන් පසු අපි カ、キ、ク、ケ、コ(ක, කි, කු, කෙ, කො) ලියන ආකාරය බලමු.

Copyright © learn-japanese-adventure.com

クレジットカード



Credit card

ケチャップ

Ketchup

コーラ

Cola

サ、シ、ス、セ、ソ (ස, ෂි, සු, සෙ, සො) ලියන්නේ මේ ආකාරයටයි.

Copyright © learn-japanese-adventure.com

サボテン

Cactus

スキー

Skiing

ソーセージ



Sausage

ඔබ ගේ 日本語の文字 පෙළ පොතෙහි පිටු අංක 34, 35 හි ඇති අභ්‍යාස කරන්න.

Provincial Department of Education- Sabaragamuwawa

Sathi Pasala

Week: 06

: SubjectJAPANESELANGUAGE

Grade: 12

Prepared by: K. O. Premathilake, Kuruwita Central Collage

第 2−1 課 それは何(なん)ですか

Aim

යම් වස්තුවක් විස්තර කිරිමට හා යම් විස්තරයක් වටහා ගැනීමට හැකි වීම.

A: あれは何ですか

ඒක මොකක්ද?

B: あれはほしですよ

ඒක තරුවක්..

Words

これ、それ、あれ、どれ、さいふ

コンピューター、ノート、ペンケース

鉛筆(えんぴつ)、国旗(こっき)、雑誌(ざっし)、辞書(じしょ)、電子辞書(でんしじしょ)、本(ほん)

Focus on

これ／それ／あれは N です

これ／それ／あれは N1 の N2 です

これ මේක

それ ඔක

あれ අරක

どれ කෝකද

- どれ සමග が නිපාතය භාවිතා වේ.
- මෙහි දී これ වලින් දෙයක් විමසූ විට පිළිතුරු දෙන්නේ それ වලිනි.

れい:

A: これは何(なん)ですか.

B: それは本(ほん)です.

- それ වලින් යමක් විමසූ විට පිළිතුරු දෙන්නේ これ වලිනි.

れい:

A: それは傘(かさ)ですか

B: はい、これは傘(かさ)ですよ

- あれ වලින් යමක් විමසූ විට පිළිතුරු දෙන්නේ あれ වලිනි.

れい:

A: あれは何ですか

B: あれは花です。





これはペンです

それはペンです





あれはペンです

れい:

これは本です。

මේක පොතක් වේ.

それは鉛筆(えんぴつ)じゃ／ではありません。

ඕක පැන්සලක් නොවේ.

A: それはノートですか。

ඕක note book එකක් ද?

B: いいえ、これはノートではありません。雑誌(ざっし)です。

නැහැ, මේක note book එකක් නොවේ. මේක සඟරාවක් වේ.

これはスリランカの国旗(こっき)です。

මේක ශ්‍රී ලංකාවේ ජාතික කොඩිය වේ.

A: ノートはどれですか

Note book එක කෝකද?

A: ノートはこれです

Note book එක මේක වේ.

- 第 2–1 課の practice A, B, C をしなさい。[Page 23,24 grade12 part1]

Provincial Department of Education- Sabaragamuwawa

Sathi Pasala

: SubjectJAPANESELANGUAGE

Week: 06

Prepared by: K. O. Premathilake, Kuruwita Central Collage

Grade: 12

第 2−2 課　ぼうしはどこですか

Aim

ස්ථානයක්,දෙයක් හෝ කිසියම් පුද්ගලයෙකු සිටින ස්ථානයක් පැහැදිළි කිරීමට හැකි වීම.

Words

ここ、そこ、あそこ、どこ、こちら、そちら、あちら、どちら

プール

池(いけ)、音楽室(おんがくしつ)、教室(きょうしつ)、職員室(しょくいんしつ)、食堂(しょくどう)、事務室(じむしつ)、体育館(たいいくかん)、図書室(としょしつ)、

売店(ばいてん)、場所(ばしょ)、理科室(りかしつ)

どこですか

Where is it?

Focus on

- ここ／ そこ／ あそこ　は　N　です.
- N　は　ここ ／ そこ ／ あそこ　です.
- こちら ／ そちら ／ あちら　は　N　です.
- N　は　こちら ／ そちら ／ あちら　です.

- ここ මෙතන
- そこ ඔතන
- あそこ අතන
- どこ කොතනද

- こちら මේ පැත්ත
- そちら ඔය පැත්ත
- あちら අර පැත්ත
- どちら මොන පැත්තද

- ස්ථානයක් පිළිබඳ ව පැවසීමෙ දී මෙම ක්‍රමය භාවිත කරයි.
- どこ､どちら යන ප්‍රශ්ණවාචී පද සමග が නිපාතය යෙදේ.
- මෙහි දී දෙදෙනෙකු කතා කරමින් සිටින අවස්ථාවක දී ඔවුන් දෙදෙනා සිටින්නේ දුරස් ව නම්,
    - අදාළ ස්ථානය කතා කරන්නා අසල පිහිටි ස්ථානයක් නම් ここ භාවිතා වේ.
    - අදාළ ස්ථානය සවන් දෙන්නා අසල පිහිටි ස්ථානයක් නම් そこ භාවිතා වේ.
    - අදාළ ස්ථානය කතා කරන්නාට හා සවන් දෙන්නා යන දෙදෙනාට ම දුරින් පිහිටි ස්ථානයක් නම් あそこ භාවිතා වේ.

- こちら、そちら、あちら යනු ආචාරශීලි ව කතා කිරීමේ දී භාවිතා කරන පද වේ.

れい：

♣ そこは図書室(としょしつ)です。

ඔතන පුස්තකාලය වේ.

♣ 音楽室(おんがくしつ)はあそこです。

සංගීත කාමරය ඔතන වේ.

♣ あちらは体育館(たいいくかん)です。

අර පැත්තේ ව්‍යායාම ශාලාව වේ.

♣ 事務室(じむしつ)はそちらです。

කාර්යාලය ඔය පැත්තේ වේ.

♣ 教室(きょうしつ)はどこ／どちらですか。

පන්ති කාමරය කොතනද? / කොයි පැත්තේ ද?

♣ どこ／どちらが売店(ばいてん)ですか。

කොතනද / කොයි පැත්තේ ද සාප්පුව ?

- 第 2−2 課の practice A, B, C をしなさい。[Page 27, 28 grade12 part1]

Provincial Department of Education- Sabaragamuwawa

Sathi Pasala

: SubjectJAPANESELANGUAGE

Week: 06

Grade: 12

Prepared by: K. O. Premathilake, Kuruwita Central Collage

第 2–3 課　あのかばんは誰(だれ)のですか。

Aim

යම් දෙයක් හෝ යම් කිසිවෙක් නිශ්චිතව හඳුනා ගැනීමට හා අයිතිය ප්‍රකාශ කිරීමට හැකි වීම.

Words

この、その、あの、どの、かばん、カメラ、サリー、スイス、

チョコレート、ドイツ、お母(かあ)さん、お父(とう)さん、女(おんな)の子(こ)、

コンピューター室(しつ)、車(くるま)、建物(たてもの)、日本(にほん)、部屋(へや)

このチョコレートは私のですよ。

Focus on

- この／その／あの　N1　は　N2　です。
- この／ その／ あの　N1　は　N2　の　です。

❖ この　මේ
❖ その　ඔය
❖ あの　ඒ, අර
❖ どの　මොන, කොයි

- この、その、あの、どの සමග අනිවාර්යයෙන්ම නාම පදයක් යෙදිය යුතු වේ.එසේ නො යෙදුවොත් එහි අර්ථයක් ගැනීමට නොහැක.

  れい: この ＋ 本(ほん)　その ＋ 図書室(としょしつ)　あの ＋ 辞書(じしょ)

  මේ ＋ පොත　ඔය ＋ පුස්තකාලය　ඒ ＋ ශබ්දකෝෂය

- මෙහි දී දෙදෙනෙකු කතා කරමින් සිටින අවස්ථාවක දී ඔවුන් දෙදෙනා සිටින්නේ දුරස් ව නම්,
  - අදාළ දෙය (もの) කතා කරන්නා අසල පිහිටියේ නම් この භාවිතා වේ.
  - අදාළ දෙය (もの) සවන් දෙන්නා අසල පිහිටියේ නම් その භාවිතා වේ.
  - අදාළ දෙය (もの) කතා කරන්නාට හා සවන් දෙන්නා යන දෙදෙනාට ම ඈතින් පිහිටියේ නම් あの භාවිතා වේ.







れい：

A: あの人(ひと)は誰(だれ)ですか。

ඒ පුද්ගලයා කවුද?

B: あの人(ひと)はサチニさんです。

ඒ පුද්ගලයා සචිනි මහත්මිය වේ.

A: この部屋(へや)は何(なん)ですか。

මේ කාමරය කුමක් ද?

B: この部屋(へや)はコンピューター室(しつ)です。

මේ කාමරය පරිගණක කාමරය වේ.

A: この本(ほん)は誰(だれ)のですか。

මේ පොත කාගෙද?

B: この本(ほん)は私(わたし)のです。

මේ පොත මගේ වේ.



A: この車(くるま)はどこのですか。

මේ කාරය කොහේ ද?

B: この車(くるま)は日本(にほん)のです。

මේ කාරය ජපානයේ වේ.

A: どの本(ほん)があなたのですか。

මොන පොත ද ඔබගේ?

B: この本(ほん)が私(わたし)のです。

මේ පොත මගේ වේ.

A: 誰(だれ)がサチニさんですか。

කවුද සචිනි මහත්මිය?

B: あの人(ひと)がサチニさんです。

අර පුද්ගලයා සචිනි මහත්මිය වේ.

ප්‍රශ්නවාචික පදයක් වාක්‍යයක මුලට යෙදුනු විට එම පදයත් සමග යෙදෙනුයේ が නිපාතයයි.

- 第 2−3 課の practice A, B, C, D をしなさい。[Page 31,32 grade12 part1]

Provincial Department of Education- Sabaragamuwawa
Sathi Pasala

: SubjectJAPANESELANGUAGE

Week: 06

Prepared by: K. O. Premathilake, Kuruwita Central Collage

Grade: 12

Unit 日本文化（にほんぶんか） – 日本の気候（にほんのきこう）

Aim

ජපානයේ දේශගුණික ලක්ෂණ පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම.



ජපානයේ භූමි ප්‍රමාණයෙන් හතරෙන් තුන් කොටසක් කඳුකර ප්‍රදේශ වන අතර ඉතිරි ප්‍රදේශ තැනිතලා සහ ගංගා මෝය වලින් සමන්විතය.උතුරේ සිට දකුණට කිලෝමීටර් 3,500 ක් (සැතපුම් 2,174) විහිදෙන ජපානයට විවිධ දේශගුණික කලාප ගණනාවක් ඇතුළත් වේ. එය සමස්ත සෞම්‍ය දේශගුණයක් ඇති අතර සෘතු හතරක් ඇත. ජපානය මුහුදින් වට වී තිබේ. ජපානය

වටා තිබෙන මුහුදේ උණුසුම් මෙන්ම සීතල දිය වැල් ගලන නිසා මත්ස්‍ය වර්ග රාශියක් ජීවත් වේ. ජපානයේ වැඩි ප්‍රදේශයක් පෘථිවියේ උත්තර සම ශීතෝෂ්ණ කලාපයේ පිහිටා තිබෙන නිසා උෂ්ණ සෘතුවේ දී පැසිෆික් සාගරයේ ගිනිකොන දිගින් හමන සුළං හා ශීත සෘතුවේ දී වයඹ දිගින් එන සුළඟත් සමග තෙත් සහිත මෝසම් දේශගුණයක් තිබේ.

දකුණු දිවයින 沖縄(おきなわ)හි අර්ධ නිවර්තන දේශගුණයක් ඇති අතර සාමාන්‍ය වාර්ෂික සෞම්‍ය උෂ්ණත්වය සෙල්සියස් 20 ක් (ෆැරන්හයිට් අංශක 72) වේ. දිවයිනට වසරකට සෙන්ටිමීටර 200 (අඟල් 80) ක වර්ෂාපතනයක් ලැබේ.



සාමාන්‍යයෙන් ජපානය වැසි අධික රටකි. ජපානයේ ව්‍යාප්ත භූගෝලීය පිහිටීම හේතුවෙන් ජපානයේ දේශගුණ විපර්යාසය සෘජු ව දක්නට ලැබේ. ජපානයේ දිගු ආක්ෂිප්ත ස්වරූපය හේතුවෙන් එක්සත් ජනපදයට සමාන දේශගුණික තත්ත්වයන්ට මුහුණ දෙයි. ජපානය වසරක් පුරා විවිධාකාර දේශගුණ ලක්ෂණ සතරකට මුහුණ දෙයි. එනම් වසන්තය 春(はる), ගිම්හානය 夏(なつ), සරත් සෘතුව 秋(あき) සහ ශීත සෘතුව 冬(ふゆ)යි. මෙහි දී අපි මේ සෘතු සතර පිළිබඳව කෙටියෙන් කතා කරමු.



වසන්ත ඍතුව 春(はる)

වර්ෂයේ මාර්තු සිට මැයි කාලය ජපානයේ හොදම කාලය ලෙස හැදින්විය හැකිය. සංචාරය කිරීමට ද ඉතා උචිත කාලය මෙම කාල සීමාව ලෙස කිව හැකිය.මෙම කාලයේ වර්ශපතයේ පහත මට්ටමක් දක්නට ලැබෙන අතර උණුසුම් නමුත් උණුසුම් නොවන සෞම්‍ය කාලගුණයක් පවතියි. ලොව පුරා ප්‍රසිද්ධ සකුරා මල් නැතහොත් චෙරී මල් විකසිත වන්නේද මේ කාලය තුලයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සංචාරකයන් බොහෝ පිරිසක් මේ කාලය තුල දක්නට ලැබීම විශේෂත්වයකි. සංචාරකයන් පමණක් නොව ජපන් ජාතිකයන් පවා මේ කාලය තුල සකුරා බැලීමට පැමිණෙයි. සකුරා ගස් යටට වී විනෝදයෙන් කාලය ගත කරයි.මෙම කාලය හනමි (hanami- 花見) ලෙස හඳුන්වයි. එහි තේරුම නම් hana – 花 යනු මලයි. mi-見 යන්නෙහි අදහස බලනවා යන්නයි. සරලව කිව හොත් මල් බලනවා යන්නයි.

ගිම්හානය 夏 (なつ)

ජූනි සිට අගෝස්තු දක්වා ගිම්හාන සමය ආරම්භ වේ. එය ආරම්භ වන්නේ ජූනි මාසයේ වැසි සහිත කලයෙනි.ජපානයේ වාර්ෂික වර්ෂාපතනයෙන් සියයට 75 පමණ ප්‍රමාණයක් ජූනි සිට සැප්තැම්බර් දක්වා කාලය තුල සිදු වේ. එවිට උෂ්ණත්වය සහ ආර්ද්‍රතාවය අගෝස්තු මාසයේ දී ෆැරන්හයිට් අංශක 90 ක් හෝ සෙල්සියස් අංශක 40 ක් පමණ ඉහළට නගිනු ඇත. අගෝස්තු ජපන් ටයිෆූන් කන්නය ආරම්භ වේ. අගෝස්තු සිට ඔක්තෝබර් දක්වා මෙම කාල සීමාව වඩා වැඩි වර්ෂාපතනයක් සහ දැඩි සුළං දිනපතා

වාර්තා වන අතර ජපානයේ සිටින විට නිතරම කාලගුණ අනාවැකි පිළිබඳව විමසිල්ලෙන් සිටිය යුතුය.වැසි සහිත කාලගුණයක් දක්නට ලැබුනද මෙම කාලය තුල පවතින්නේ දැඩි උණුසුම් ස්වභාවයකි. ඇත්තෙන්ම තරමක් අපහසුය.ගිම්හානයේ බොහෝ ජපන් වැසියන් මුහුදු යාමට කැමැත්තක් දක්වන අතරම මල් වෙඩි සංදර්ශන ද දක්නට ලැබේ.

සරත් කාලය 秋(あき)

මෙම කාලය තුල උණුසුම් තෙතමනයක් සහිත කාලගුණයක් දක්නට ලැබෙන අතර මේ කාලය වඩාත් සුවදායී විනෝදජනක කාලයක් ලෙස හැදින්විය හැකිය.ජපානයේ සංචාරය කිරීමට වඩාත් යෝග්‍ය කාලයක් ලෙස ද හැදින්විය හැකිය. සැප්තැම්බර් සිට නොවැම්බර් කාලය තුල සිසිල් සුළං හමන ප්‍රබෝධමත් කාලයක් ලෙස හැදින්විය හැකිය. මේ කාලය තුල ශාක පත්‍ර අලංකාරවත් රතු පැහැති වර්ණයන්ට හැරීම දක්නට ලැබෙන තර එය ඉතා සුන්දර දසුනකි.සරත් කාලය වියලි මෘදු ස්වභාවයකින් යුක්තයි.

ශීත සෘතුව 冬(ふゆ)

හිම වැටෙන කාලය ජපානයේ සුන්දරතම දසුන් මවන්නේ උතුරු ප්‍රදේශයේයි. ඇත්තෙන්ම පාරාදීසයකි. ජපානයේ උතුරු හා බටහිර වෙරළ තීරය ශීත සෘතු ක්‍රීඩා සඳහා වඩාත් යෝග්‍ය වේ. පෙබරවාරි මාසයේ දී වාර්ෂික ස Sapporo Snow Festival පැවැත්වේ. මෙම උත්සවය ජපානයේ විශාලතම ශීත සෘතු සිදුවීම් අතරින් එකක් වන අතර, එහි හිම සහ අයිස් වලින් සෑදූ අලංකාරවත් මූර්ති දක්නට ලැබෙයි. ෆුජී ගිනිකන්ද වඩාත්

සුන්දර ව දිස්වන කාලය ලෙස ද හැදින්විය හැකිය.දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා ඉතා කෙටි කාලයක් පවතින සීත කාලයේ සවස 5.00 පමණ වන විට ඉර බැසීම සිදුවේ.දැඩි සීතලක් පවතින අතර එය සෙල්සියස් අංශක සෘණ අගයක වර්ධනයක් දක්නට ලැබේ. සීත කාලය තුල හොදින් ඇඟ වැසෙන පරිදි ඇද සිටීම ඉතාමත් වැදගත් දෙයක් ලෙස හැදින්විය හැකිය.